විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උ.ප.දෙස්.ලිපි.අංක: 01/2022
ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................
දිනය / திகதி / Date } 2022.03.11

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

<u>රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම</u>

2022.01.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2022 සහ අංක 2263/5 හා 2022.01.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ හා 17 වගන්ති 2022.01.01 දින සිට බලාත්මක වන පරිදි සංශෝධනය කර ඇත.

02. 2012.02.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර අංක 1743/28 මගින් 1953 අංක 44 දරන පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් පනත සහ 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත යටතෙහි විශ්‍රාම වැටුප් හිමිකම් ලබන ගුරුවරුන්ට ද 2018.08.16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර අංක 2084/59 මගින් 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත සහ එහි ආනුෂාංගික පනත් හා රෙගුලාසි යටතෙ හි විශ්‍රාම වැටුප් හිමිකම් ලබන පළාත් පාලන සේවකයන්ට ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ඒ ආකාරයටම බලපාන බවට දක්වා ඇත.

03. එමනිසා පිරිවෙන් ගුරුවරුන් රජයේ අනුමත පුද්ගලික පාසල්වල ගුරුවරුන් හා තවදුරටත් පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ සිටින පළාත් පාලන සේවකයන්ට ද ඉහත 02 හි සංශෝධිත විධිවිධාන අනුව වයස අවුරුදු 65 දක්වා සේවය කළ හැක.

04. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව වයස අවුරුදු 65 සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව වයස අවුරුදු 63 ලෙස දක්වා ඇත. 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත අනුව මහාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම

ගැන්වීමේ වයස් සීමාව වයස අවුරුදු 61ලෙස දක්වා ඇත. ඒ අනුව මෙම නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ ඉහත 02 හි සංශෝධිත විධිවිධාන අදාළ නොවේ.

05. තවද 'ට' උපලේඛනගත නිලධාරීන් සම්බන්ධයෙන් පහත දැක්වන උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

I. 'ට' උපලේඛනයේ නිශ්චිතව සඳහන් ධුරයකට හෝ තනතුරකට, රාජ්‍ය සේවයට පිටතින් පත් කරනු ලැබූ නිලධාරියෙකු එම තනතුර, මාස එකසිය විස්සක් හෝ ඊට වැඩි කාලයක් දරනු ලැබුයේ නම් මුල් අවුරුදු 10 සඳහා ඔහුගේ වැටුපෙන් 1/3 කට සමාන වූ ද ඊට පසුව වැඩි වන එක් එක් සම්පූර්ණ සේවා අවුරුද්දක් වෙනුවෙන් වැටුපෙන් 1/30ක් බැගින් වූ ද විශ්‍රාම වැටුපකට හිමිකම ලබයි. ඒ අනුව, උපරිම සේවා කාලය අවුරුදු 20 ක් වෙනුවෙන් අවසාන වරට ලැබූ වැටුපෙන් 2/3 ක උපරිමය දක්වා වූ විශ්‍රාම වැටුපක් හිමි වේ. අකාර්යක්ෂමතාව හෝ විෂමාචාරය මත එවැනි නිලධාරියෙකුගේ සේවය අවසන් වන්නේ නම්, එම හිමිකම නොලැබේ.

II. විශ්‍රාම ගැන්වීමේ දිනය 2022.01.01 දින හෝ ඊට පසු යෙදෙන 'ට' උපලේඛනගත නිලධාරීන් සඳහා ඉහත (I) විධිවිධාන අදාළ වේ.

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :**

1. ජනාධිපති ලේකම් -කරු. දැ. ගැ. ස.
2. අග්‍රාමාත්‍ය ලේකම් -කරු. දැ. ගැ. ස.
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් -කරු. දැ. ගැ. ස.
4. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය -කරු. දැ. ගැ. ස.
5. ලේකම්, මුදල් අමාත්‍යාංශය -කරු. දැ. ගැ. ස.
6. පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව -කරු. දැ. ගැ. ස.
7. විගණකාධිපති -කරු. දැ. ගැ. ස.